පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය- 7 (3 වාරය)

විෂය:- :- ගණිතය

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

## ත්‍රිකෝණ නිර් මාණය

26.1 නිර් මාණ

- 7 ශ්‍රේණියේදී, නිර් මාණ පිළිබඳව ඔබ උගත් කරුණු සිහිපත් කර ගන්න.
- පාදයක දිග 6cm වන ABC සමපාද ත්‍රිකෝණය පහත පියවර අනුගමනය කරමින් නිර් මාණය කරන්න
    1. 6cm ට වඩා වැඩි දිගක් සහිත සරල රේඛා ඛණ්ඩයක් නිර් මාණය කරන්න. එහි එක් අන්තයක ලක්ෂ්‍යයක් ලකුණු කර A ලෙස නම් කරන්න.
    2. කවකටුව 6cm ලෙස සකස් කරගෙන A හි තුඩ තබා සරල රේඛාව මත චාපයක් ලකුනු කර ඡේදන ලක්ෂ්‍යය B ලෙස නම් කරන්න.
    3. කවකටුවේ තුඩ A හි තබා රේඛාවට ඉහලින් චාපයක් අඳින්න. නැවත කවකටු තුඩ B හි තබා පෙර ඇඳි චාපය කැපෙන සේ චාපයක් අඳින්න.( කවකටු දුර 6cm ම වන සේ)
    4. චාප දෙක ඡේදනය වන ලක්ෂ්‍යය C ලෙස නම් කර, AC හාBC යා කර ABC ත්‍රි කෝණය සම්පූර් ණ කරන්න.
- සවිධි ෂඩස්‍රය නිර් මාණය කරන අයුරු සිහිපත් කර ගෙන, පාදයක් 6cm වන සවිධි ෂඩස්‍රය නිර් මාණය කරන්න.
- පෙළපොතේ (2 කොටස) 116 පිටුව අධ්‍යයනය කර පුණරීක්ෂණ අභ්‍යාසයට පිළිතුරු ලියන්න.

26.2 දී ඇති රේඛා ඛණ්ඩ තුනක් ත්‍රි කෝණයක පාද වීමට සපුරාලිය යුතු අවශ්‍යතාවක් හඳුනා ගැනීම

- 117 හා 118 පිටු අධ්‍යයනය කර ක්‍රියාකාරකම 1 කරන්න.
- ත්‍රි කෝණයක ඕනෑම පාද දෙකක දිගෙහි ඓක්‍යය ඉතිරි පාදයේ දිගට වඩා විශාල වේ.
- යම් රේඛා ඛණ්ඩ තුනකින්, ඕනෑම රේඛා ඛණ්ඩ දෙකක දිගවල ඓක්‍යය අනෙක් රේඛා ඛණ්ඩයේ දිගට වඩා අඩු නම්, එම රේඛා ඛණ්ඩ තුන ත්‍රිකෝණයක පාද වන සේ ත්‍රිකෝණයක් නිර් මාණය කළ නොහැකිය.
- 26.1 අභ්‍යාසය කරන්න.